ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.2.1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නව ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව (SLFRS & LKAS) පිළියෙල කර ඇති බව දක්වා තිබුණත්, පාරිතෝෂික සහ සේවක ණය සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). ජර්නල් සටහන් වෙනුවෙන් ජර්නල් වවුචර් පිළියෙල කර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය යුතු ගොඩනැගිලි කුලී රු.180,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු පර්යේෂණ දීමනා රු.11,250 ක් ද, ඒ වෙනුවෙන් ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් රු.900 ක් ද මූල්‍ය ප්‍රකාශනයෙන් අත්හැරී තිබුණි.

1.2.3 නීති, රීති, හා රෙගුලාසි වලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරික්ෂණය විය.

| නීති, රීති, හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත | |
| මුදල් පනතේ 14(1) වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක. පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය | කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසන්වී දින 150 ක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, අවසන් වරට 2010 වර්ෂයේ වාර්ෂික වාර්තාව සභාගත කර තිබුණි. |
| (ඇ) 2011 පෙබරවාරි 09 දිනැති අංක.13/2008(iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 ඡේදය | දෙපාර්තමේන්තු ප්‍රධානියාට අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය 140 ක් වුවද, එම සීමාව ලීටර් 405 කින් ඉක්මවා රු.48,810 ක ඉන්ධන දීමනාවක් ද ගෙවා තිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි | |
| මු.රෙ. 225 | අවස්ථා 24 කදී එකතුව රු.6,053,290 ක් සඳහා වවුචර් පිළියෙල නොකර ගෙවීම් කර තිබුණි. |
| මු.රෙ. 756 | 2012 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2013 අප්‍රේල් 01 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

1.2.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---

ආයතනය විසින් වාර්ෂිකව ආණ්ඩුව වෙත ඉදිරිපත් කරනු ලබන "ඉකුත් වර්ෂයේ ශ්‍රී ලංකාව තුළ කරන ලද විද්‍යා තාක්ෂණ කටයුතු සමාලෝචන වාර්තාව" සකස් කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලින් තොරතුරු ලබාගැනීම වෙනුවෙන් එකී ආයතන වෙත ගාස්තු නොගෙවා ඒ ඒ නිලධාරීන් වෙත රු.88,000 ක් ගෙවා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම්වලට අදාළ රජයේ ප්‍රදානය වූ රු.15,448,150 ක් ගණන් ගැනීමෙන් පසු සභාවේ වැඩ කටයුතු වලින් රු.38,698 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් වූ රු.12,662,000 ක රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසු මූල්‍ය ප්‍රතිඵලය රු.808,065 ක ඌනතාවයක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.769,367 ක වර්ධනයක් ඇතිවීම සඳහා පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.2,786,150 ක් රජයේ ප්‍රදාන වැඩිවීම බලපා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---

3.1 කාර්යසාධනය

---

මූල්‍යමය ප්‍රගති වාර්තාවක් පමණක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු අතර, භෞතික කාර්යසාධන වාර්තාවක් 2013 මාර්තු 30 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

වැඩබැලීමේ තනතුරක් දීර්ඝ කාලයක් සම්පූර්ණ නොකර සිටින අවස්ථාවලදී එම තනතුර තවදුරටත් තබා ගැනීමේ අවශ්‍යතාවය අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් විමසා බැලිය යුතු වුවත්, එසේ නොකර 2010 අගෝස්තු 01 වන දින සිට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ලෙස වැඩබැලීමේ තනතුරක් වර්ෂ 02 කුත් මාස 04 ක කාලයක් අඛණ්ඩව පවත්වා ගෙන ගොස් තිබුණි.

3.3 ආර්ථික නොවූ ගනුදෙනු

කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී විද්‍යා හා තාක්ෂණ ආයතනයන් 05 ක් සමාලෝචනය (Review) කළයුතු වුවද, රු. 382,795 ක් වැය කර ආයතන 02 ක් පමණක් සමාලෝචනය කර තිබුණි. එම සමාලෝචන වාර්තා පිළිබඳව පසුවිපරමක් නොකරන බැවින් සමාලෝචනය සඳහා දරන ලද වියදම් නිෂ්ඵල වී තිබුණි.

3.4 හඳුනාගත් පාඩු

ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදය හා තරුණ විද්‍යාඥයන්ගේ සංසදය සඳහා වැඩමුළු 02 ක් පැවැත්වීමට ආයතනය රු.53,800 ක් වැය කර තිබුණු අතර, ඒ සඳහා සංසදයෙන් එකතු වූ සාමාජික මුදල රු.38,592 ක් වූ බැවින් රු.15,208 ක පාඩුවක් ආයතනයට සිදුවී තිබුණි.

3.5 කාර්යමණ්ඩල පරිපාලනය

කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩල නිලධාරීන් 18 දෙනෙක්ද, තථ්‍ය කාර්යමණ්ඩල 14 දෙනෙකුගෙන්ද සමන්විත වූ අතර, තථ්‍ය කාර්යමණ්ඩලයේ නිලධාරීන් 04 දෙනෙකු එකී නිලධාරියා සේවයේ නියුක්ත වනතුරු පමණක් එම තනතුර අදාළ වන බැවින් සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 05 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය වෙන් වශයෙන් පිහිටුවා නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් විගණනය කර එක් විගණන විමසුමක් පමණක් නිකුත් කර තිබුණි.

## 4.2 අයවැය පාලනය

කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වන විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම් සඳහා සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.5,052,000 ක් ලෙස අධි අයවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. එම අයවැය නැවත රු.1,752,000 දක්වා සියයට 65 කින් අඩුකර සංශෝධනය කර තිබුණි. නමුත් වර්ෂයේ තථ්‍ය වියදම රු.810,013 ක් වූ අතර, ඒ අනුව මූලාමය කාර්යසාධනය සියයට 46 ක් වී තිබුණි. ඒ අනුව අයවැය ඇස්තමේන්තුව මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන.

විගණනයේදී නිරීක්ෂණ වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ). නව ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුගතවීම.

(ආ). අයවැය පාලනය.